# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 2171635 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1823 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 10/12/2024 පැය 0600

## මාධ්‍ය නිවේදනය

### 01. සැකකටයුතු මරණයක් - මදුරන්කුලිය පොලිස් වසම.

2024.12.10 වන අද දින අළුයම් කාලයේදී මදුරන්කුලිය පොලිස් වසමේ වජිරවත්ත මාර්ගයට හැරෙන හන්දිය අසල පිහිටි බස්නැවතුම්පලක වැටී සිටි පුද්ගලයෙකු පුත්තලම රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් සිට ඇති බවට මදුරන්කුලිය පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 55 ක් වූ මදුරන්කුලිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණය සිදු වූ ආකාරය සම්බන්ධයෙන් මෙතෙක් තොරතුරු අනාවරණය වී නොමැති අතර මරණකරු රාත්‍රී කාලයේ හිතවතුන් පිරිසක් සමඟ මත්පැන් පානය කර ඇති බවට තොරතුරු අනාවරණය වී ඇත. මදුරන්කුලිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

### 02. වාලම්පුරි දෙකක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - ජාඇල පොලිස් ස්ථානය.

2024.12.09 වන දින සවස් කාලයේ ජා ඇල පොලිස් වසමේ වැලිගම්පිටිය ප්‍රදේශයේදී ජාඇල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර ලක්ෂ 18 ක මුදලකට අලෙවි කිරීමට සූදානම් කර තිබූ වාලම්පුරි දෙකක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 31 හා 32 වයස්වල පසුවන කොබෙයිගනේ ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

ජා ඇල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. නීති විරෝධී ලෙස මෙරටට දුම්වැටි රැගෙන එන ලද සැකකාරියන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ කටුනායක ගුවන්තොටුපල ඒකකය.**

2024.12.10 වන දින අළුයම් කාලයේදී පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය කටුනායක ගුවන්තොටුපල ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර **තීරුබදු රහිතව ඩුබායි රාජ්‍යයේ සිට මෙරටට රැගෙන එන ලද සිගරට් 13000 ක් (කාටුන් 65) ක් සන්තකයේ තබාගෙන සිටි සැකකාරියක් සහ සිගරට් 7000 ක් (කාටුන් 35) ක් සන්තකයේ තබාගෙන සිටි සැකකාරියක්** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරියන් අවුරුදු 33 හා 52 වයස්වල පසුවන මොරටුව හා මීරිගම ප්‍රදේශවල පදිංචිකාරියන් වේ.**

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ කටුනායක ගුවන්තොටුපල ඒකකය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**04. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මොරටුව පොලිස් ස්ථානය.**

2024.12.09 වන දින රාත්‍රී කාලයේ මොරටුව පොලිස් වසමේ ලුනාව තට්ටයා පාලම අසලදී මොරටුව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 600 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 40 ක් වන අඟුලාන, මොරටුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මොරටුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - තලංගම පොලිස් ස්ථානය.**

2024.12.09 වන දින රාත්‍රී කාලයේ තලංගම පොලිස් වසමේ දර්ශන ප්‍රදේශයේදී තලංගම පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත පුද්ගලයෙකු පරීක්ෂා කිරීමේදී ඔහු සන්තකයේ තිබී තබා **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 100 ක්** සමඟ සැකකරු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42 ක් වන තලංගම උතුර, බත්තරමුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

තලංගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2024.12.09 වන දින දහවල් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ රත්මලාන දුම්රියපොල අසලදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 100 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 37 ක් වන අඟුලාන, මොරටුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරුගෙන් සම්බන්ධයෙන් සිදුකරන ලද වැඩිදුර විමර්ශනයේදී සැකකරු ගල්කිස්ස පොලිස් වසමේ නිවෙස් බිඳ දේපල සොරකම් කිරීමේ සිද්ධීන් කිහිපයක් සිදුකර ඇති අතර එම සොරා ගත් දේපල වලින් කොටසක් පොලිස් භාරයට ගෙන ඇත. ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. ගංජා හේනක් වටලා මෙරට නිෂ්පාදිත ගිනි අවි 02 ක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - ඇතිමලේ පොලිස් ස්ථානය.

2024.12.09 වන දින දහවල් කාලයේ ඇතිමලේ පොලිස් වසමේ හත්ආර ප්‍රදේශයේදී ඇතිමලේ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **මෙරට නිෂ්පාදිත ගිනි අවි දෙකක් සහ වගා කර තිබූ ගංජා ගස් 478 ක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 28 හා 33 වයස්වල පසුවන මහඔය හා සියඹලාණ්ඩුව යන ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

ඇතිමලේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 08. බලපත්‍ර නොමැතිව මැණික් ගැරූ සැකකරුවෙකු අත්අඩංගුවට - මස්කෙළිය පොලිස් ස්ථානය.

2024.12.09 වන දින දහවල් කාලයේ මස්කෙළිය පොලිස් වසමේ ගවරවිල වත්තේදී මස්කෙළිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් **බලපත්‍ර නොමැතිව මැණික් ගරමින් සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 43 ක් වන ගවරවිල වත්ත, අප්කට් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මස්කෙළිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 09. දුම්රියේ ගැටී පුද්ගලයෙකු මියයාමක් - හලාවත පොලිස් වසම.

2024.12.09 වන දින දහවල් කාලයේ හලාවත පොලිස් වසමේ වට්ටක්කල්ලිය දුම්රිය හරස් මාර්ගය හරහා ගමන්ගත් යතුරුපැදියක් කොටුව සිට පුත්තලම දක්වා ධාවනය වූ දුම්රියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදියේ ගමන්ගත් එක් පුද්ගලයෙකු මියගොස් තවත් පුද්ගලයෙකු තුවාල ලබා හලාවත රෝහලේ ප්‍රතිකාර ලබයි.

**මරණකරු වයස අවුරුදු 18 ක් වූ ඇලපාර, වට්ටක්කල්ලිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘතශරීරය හලාවත රෝහලේ මෘතශරීරාගාරයේ තැන්පත් කර ඇත. හලාවත පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 10. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගෝනගංආර පොලිස් ස්ථානය.

2024.12.09 වන දින සවස් කාලයේ ගෝනගංආර පොලිස් වසමේ බෝධි හංදිය අසල ප්‍රදේශයේදී ගෝනගංආර පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක්

විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 45 ක් වන බුත්තල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගෝනගංආර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 11. මාරක රිය අනතුරක් - බක්කිඇල්ල පොලිස් වසම.

2024.12.09 වන දින සවස් කාලයේ බක්කිඇල්ල පොලිස් වසමේ අම්පාර මහඔය ප්‍රධාන මාර්ගයේ රජගලතැන්න ප්‍රදේශයේදී අම්පාර දෙස සිට මහඔය දෙසට ධාවනය වූ ලොරි රථයක ඊට ප්‍රතිවිරුද්ධ දිසාවෙන් පැමිණි යතුරුපැදියක් මුහුණට මුහුණ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදිකරු බරපතල තුවාල ලබා ගොනාගොල්ල සෙනරත්පුර රෝහලට ඇතුළත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 47 ක් වූ සේනාගම, වැරැන්කැටගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය ගොනාගොල්ල සෙනරත්පුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරට සම්බන්ධ ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර බක්කිඇල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 12. මාරක රිය අනතුරක් - නොරොච්චෝලය පොලිස් වසම.

2024.12.09 වන දින රාත්‍රී කාලයේ නොරොච්චෝලය පොලිස් වසමේ කල්පිටිය පාලවිය ප්‍රධාන මාර්ගයේ ආණ්ඩන්කන්නිය ප්‍රදේශයේදී පාලවිය දෙස සිට කල්පිටිය දෙසට ධාවනය වූ ලියාපදිංචි නොකළ යතුරුපැදියකින් ගමන් කරමින් සිටි පසු පැදිකරු මාර්ගයේ ඇද වැටී ඊට පසුපසින් එම දිසාවෙන්ම පැමිණි කාර් රථයේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් කාර් රථය නොනවත්වා පලා ගොස් ඇති අතර බරපතල තුවාල ලැබූ පසු පැදිකරු පුත්තලම රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත. යතුරුපැදිය පැද වූ පැදිකරු මරණකරුගේ පියා වේ.

**මරණකරු වයස අවුරුදු 25 ක් වූ කුරුඤ්ඤංපිටිය, කල්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පුත්තලම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. පැදිකරු අත්අඩංගුවට ගෙන ඇති අතර පලා ගිය කාර් රථයේ රියදුරු අත්අඩංගුවට ගැනීම සඳහා නොරොච්චෝලය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**